We Deliver Results....

Susantha Katugampala
Barrister & Solicitor
Immigration Lawyer
Migration Agent Reg: 96/86306

FAIRFIELDS
IMMIGRATION LAWYERS - MELBOURNE

Tel : (03) 9650 4557 Fax : (03) 9650 4559
10 Morrison Place East Melbourne 3002

3 වන පිටෙන්

පුපුරවමින් සමහරු උත්සාහ කරන්නේ සෝල්හයිම්ට විරෝධය පළ කරනවාට වඩා ජනතාවගේ සිත් තුළ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජය අප්‍රසාදයට පත් කිරීමට ගිනි මෙළවීමයි. ''මහින්දගේ ආණ්ඩුව යටතේ කොළඹත් බෝම්බ පුපුරවනවා....'' යැයි කියන්නට එජාපයට උල්පන්දම් දීමයි.

මේ අතර එජාප නායක රනිල් වික්‍රමසිංහ මහතා මුහුණ දී සිටින්නේ අසීරු තත්ත්වයකටය. මෙම ලිපිය ලියන ජනවාරි 26 වැනිදා වෙනවිට විපක්ෂයේ ප්‍රධාන සංවිධායක හා එජාප කථිතර දිස්ත්‍රික් නායක මහින්ද සමරසිංහ සහ මහනුවර දිස්ත්‍රික් එජාප මන්ත්‍රී කෙහෙළිය රඹුක්වැල්ලද යන දෙදෙනා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුවට එකතු වී ඇමැතිකම් ද ලබාගෙන අවසන් ය.

මහින්ද සමරසිංහ ආණ්ඩුවට එකතු වීමට ප්‍රධාන හේතුව වූයේ ඔහුට එරෙහිව තිබෙන බරපතල අල්ලස් දූෂණ වංචාවක් යැයි ආරංචි මාර්ග පවසයි. මේ අතර පී.එල්. පීරිස් එජාප මන්ත්‍රීවරයාද මහින්ද රාජපක්ෂ මහතාගේ ආණ්ඩුවට සම්බන්ධ වීමට කැමැත්ත පළකර ඇතත් ඊට ජනතා විමුක්ති පෙරමුණ විරෝධය පළකර තිබෙන බවත් දැනගන්නට ලැබිණ.

මොවුන් තුන්දෙනාට අමතරව සුසන්ත පුංචිනිලමේ, සූරියආරච්චි , නවීන් දිසානායක, නියෝමාල් පෙරේරා යන එජාප මන්ත්‍රීවරුන්ද මහින්ද රාජපක්ෂ මහතාගේ ආණ්ඩුවට එකතු වීමට කැමැති බව දන්වා ඇත.

රනිල්ව පක්ෂ නායක කමින් ඉවත් කිරීමට රාපිත සේනාරත්න, මහින්ද විජේසේකර ඇතුළු පිරිසක් දැඩි උත්සාහයක් දරද්දී පක්ෂයේ මන්ත්‍රීවරුන් ආණ්ඩුවට සම්බන්ධවීම ගැහෙන් වැටුන මිනිහට ගොනා ඇන්නා වැනි සිද්ධියකි. මීට විසඳුමක් වශයෙන් රනිල් වික්‍රමසිංහ ආණ්ඩුවට අභියෝගයක් එල්ල කළා. තමන්ගේ පක්ෂය කඩමින් මන්ත්‍රීවරුන් බිලි බා ගන්නව නම් සාම සාකච්ඡා සඳහා කොන්දේසි විරහිතව ආණ්ඩුවට සහය පළ කිරීමට එජාපය ඉදිරිපත් කළ යෝජනාව ඉල්ලා අස්කර ගන්නා බවයි රනිල් වික්‍රමසිංහ ආණ්ඩුවට පැවසුවේ.

තමන්ව එලවා ගන්නට පෙරළි කරන මන්ත්‍රීවරුන්ගෙන් බේරෙන්න රනිල් වික්‍රමසිංහ කරු ජයසූරියට ඇථත් බලතල කීපයක් පසුගියදා ලබා දුන්නා. හැබැයි ඒ ලිඛිතව නෙවෙයි. වාචිකව. ලියුම් කරදාසියකින් ඒ බලතල ලියා දුන්නත් වැඩක් වෙන්නේ නැහැ. ඇයි වැඩක් වෙන්නේ නැත්තේ.

රනිල් වික්‍රමසිංහ කියන්නේ කපටි දේශපාලනයෙන් හොඳ පන්නරයක් ලැබූ දේශපාලනඥයෙක්. කරුට පක්ෂ නායකකම ලබා දෙන්න කැරළි ගහන මන්ත්‍රීවරුන් නිහඬ කරවන්නට බලතල කරුට දුන්නත් ඒවා ප්‍රායෝගික නැහැ. ප්‍රායෝගික බලතල කරුට ලබා දෙන්න නම් රනිල් වික්‍රමසිංහ මහතා එජාප පක්ෂ ව්‍යවස්ථාව වෙනස් කරන්න ඕනේ. එජාප ව්‍යවස්ථාව එසේ මෙසේ එකක් නෙවෙයි. ඒකාධිපති බලතල රැසක් මෙම ව්‍යවස්ථාවෙන් පක්ෂ නායකයාට ලබා දී තිබෙනවා. ඒ වගේ ව්‍යවස්ථාවක් සංශෝධනය කොට කරු ජයසූරියට ඒකාධිපති බලතල පැවරීමක් රනිල් වික්‍රමසිංහගේ මේ ආත්ම බවයේදී සිදු නොවන බවයි ඔහුගේ හිතවතුන් ලියුම්කරු සමග පවසා සිටියේ. මේ අතර කොට්ටාශ මට්ටමින් එජාප සංවිධායකවරුන් රනිල්ගෙන් බලවත් ලෙස ඉල්ලා සිටින්නේ කරුට පක්ෂයේ බලතල පවරන්නේ නැතිව එජාප නායකත්වයේ දිගටම රැඳී සිටින ලෙසයි.
එජාප නායකයා මේ වගේ අර්බුදයක පැටලී සිටියත් ඔහු ඉතා තියුණු ලෙස ආණ්ඩුවේ හැසිරීම හා සාම වැඩපිළිවෙල නිරීක්ෂණය කරන බවයි ඔහුගේ හිතවතුන් පවසන්නේ. විශේෂයෙන් 'ඒකීය' යන වචනය ඇතුළේ සිර වී සිටින ආණ්ඩුව එයින් ගොඩ එන්නේ කොහොමදැයි කියන කාරණාවට රනිල්ගේ අවධානය වැඩි බව සඳහන්.

ඒකීය රටක් ඇතුළේ බලය බෙදා හැරීමට ජවිපේ එකඟ නැහැ. කොට සංවිධානය කියන්නේ එක්සත් රටක් ඇතුළේ මිස ඒකීය රටක් ඇතුළේ පෙඩරල් විසඳුමකට යාමට තමන් සූදානම් නැති බවයි. මේ වෙලාවේ ජපානය ඇතුළු අන්තර්ජාතික ප්‍රජාව ආණ්ඩුව පැත්තට හරවා ගැනීම ආණ්ඩුවට තිබෙන තවත් අභියෝගයක් බව එජාපය දනී. ඒ අන්තර්ජාතික ප්‍රජාව එක්සත් රටක් ඇතුළේ විසඳුමකට පැමිණිය යුතු බව පවසන බැවින්. අන්තර්ජාතික ප්‍රජාව ආණ්ඩුව පැත්තට දිනා ගන්නට අසමත් වුවහොත් ඔවුන් කොට සංවිධානය හරි යැයි කියන තැනට තල්ලු වීම ආණ්ඩුව මුහුණ දෙන ඊළඟ අභියෝගයයි.

ලබන මාර්තුවේ දී හෝ අප්‍රේල් මාසයේදී පවත්වන්නට නියමිත පළාත් පාලන මැතිවරණයේදී මහින්ද රාජපක්ෂ ජනාධිපති තුමාගේ ආණ්ඩුවටත්, එජාපයටත් ජනතාව ඉදිරියට ගොස් පවසන්නට වැදගත් කරුණු කාරණා තිබෙන්නේ ඕනෑ. විශේෂයෙන් එජාපයට වැදගත් වන්නේ ආණ්ඩුවේ සාම වැඩපිළිවෙළ විවේචනයට ලක් කිරීමයි. එජාපයට පළාත් පාලන මැතිවරණයේ දී ජයග්‍රහණයක් ලබන්නට නම් ආණ්ඩුව රටේ ප්‍රධාන ප්‍රශ්න පාලනය කරන්නේ කොහොමදැයි කියන කාරණාව ඉතා වැදගත්. රටේ ප්‍රධාන කාරණා වන්නේ සාම වැඩපිළිවෙළ, බඩුමිල වැඩිවීම, රටේ ආරක්ෂක තත්ත්වය හා දූෂණ වංචා යන කාරණාවන්ය.

මෙම කරුණු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව මැනවින් පාලනය කළහොත් පළාත් පාලන මැතිවරණයෙන්ද විශිෂ්ඨ ජයග්‍රහණයක් ලබන්නට පුලුවන්. එසේ නොවුණහොත් එම තත්ත්වය එජාපයට වාසිදායක අනාගතයක් ළඟා කර දෙන්නට සමත් බවයි පෙනෙන්නේ. මෙම පළාත් පාලන මැතිවරණයේදී ජනතා විමුක්ති පෙරමුණ තනිවම තරඟ කරන බවක් පසුගියදා කියැවුණා. ඒත් ජවිපේ දීර්ඝ කාලීන අනාගත අරමුණු මොනවාදැයි කල්පනා කරන කොට පළාත් පාලන මැතිවරණයට හෝ වෙනත් මැතිවරණයට ජවිපේ හදිසියේ තනිවම තරග වදීවී යැයි සිතන්නට අමාරුය. ■

සීයග් මුනුබුරග්

- සීයාහ්, 'බස්ඩ් ෆ්ලූ' හැදිලා කුකුල්ලු කලු කුන්නු මැරෙන එක හොඳයි වගේ නෙහ්?
- මොන හොඳද්ද කොල්ලෝ කී දෙනෙකුගෙ බඩට වදිනවාද? හරක් මස් බැටලු මස් ගිනි ගනං යයි
- ඒකට කමන් නෑ.. මිනිස්සු එතකොට ඌ මරලා පවි පුරෝ ගන්නෑනේ
- ඒ... ච.. ක හරි ඉ එතකොට හරක් බැටලුවො ?
- ඃ ආ..... උන්ද? උන්ටත් පස්සෙ කැටලු ෆ්ලූ ෂීප් ෆ්ලූ හැදුනා් ම හරි නේ වික